මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT


මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 -2484500, 011- 2484600, 011- 2484700
ෆැක්ස් / தொலை நகல் / Fax: 011- 2449823
වෙබ් අඩවිය / இணைய தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No:
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2026.08.05

# ප්‍රවෘත්ති නිවේදනය

ප්‍රවෘත්ති අධ්‍යක්ෂතුමා / කළමනාකාරතුමා,

**අවසර නොලද නීතිවිරෝධී අන්තර්ජාල සූදු වෙබ් අඩවි 24ක් ශ්‍රී ලංකාව තුළ වහාම ක්‍රියාත්මක වන පරිදි අවහිර කෙරේ.**

ශ්‍රී ලංකාව තුළ වලංගු බලපත්‍රයක් ලබා නොගෙන නීතිවිරෝධී ලෙස අන්තර්ජාල සූදු සහ ඔට්ටු ඇල්ලීමේ සේවාවන් පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවි 24කට ශ්‍රී ලංකාව තුළ සිට පිවිසීම (Access) වහාම ක්‍රියාත්මක වන පරිදි අවහිර (Block) කිරීමට පියවර ගෙන තිබේ.

මෙම පියවර ගෙන ඇත්තේ මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය විසින් 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනතේ (Gambling Regulatory Authority Act, No. 17 of 2025) ප්‍රතිපාදන සහ බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) වෙත සිදු කළ දැනුම් දීමකට අනුවය.

ඒ අනුව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සියලුම විදුලි සංදේශ සේවා සපයන්නන් වෙත අදාළ වෙබ් අඩවි ශ්‍රී ලංකාව තුළ සිට ප්‍රවේශ වීම වහාම ක්‍රියාත්මක වන පරිදි අවහිර කිරීමට අවශ්‍ය උපදෙස් නිකුත් කර ඇත.

සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනතේ 15, 16 සහ 18 වගන්ති යටතේ නියමිත වලංගු බලපත්‍රයක් ලබා නොගෙන ශ්‍රී ලංකාව තුළ අන්තර්ජාල සූදු සේවාවන් පවත්වාගෙන යාම හෝ එවැනි සේවාවන් ප්‍රවර්ධනය කිරීම පනතේ 44 වගන්තිය ප්‍රකාරව දඬුවම් ලැබිය හැකි වරදකි.

වහාම ක්‍රියාත්මක වන පරිදි අවහිර කරන ලද නීතිවිරෝධී අන්තර්ජාල සූදු වෙබ් අඩවි:

1. 1xbet.com
2. betway.com/en-lk
3. 22bet.com
4. melbet.com
5. unibet.com

6. betfair.com

7. dafabet.com

8. bet365.com

9. 1win.com

10. spinbetter.com

11. 10cric.com

12. bc.game

13. megapari.com

14. pin-up.bet

15. stake.com

16. mostbet.com

17. parimatch.com

18. betwinner.com

19. linebet.com

20. 4rabet.com

21. rajabets.com

22. dbbet.com

23. coldbet.com

24. WinWin

නීතිමය රාමුවෙන් බැහැරව ක්‍රියාත්මක වන මෙවැනි අවසර නොලද අන්තර්ජාල සූදු වේදිකාවන්හි නිරත වීමෙන් සහ ඒවාට මුදල් ආයෝජනය කිරීමෙන් වළකින ලෙස මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

සූදු ක්‍රීඩා නියාමනය ශක්තිමත් කිරීම, නීතිවිරෝධී අන්තර්ජාල සූදු ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම සහ මහජනතාවගේ මූල්‍ය සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා ඉදිරියටත් අදාළ නියාමන ආයතන සමඟ එක්ව අවශ්‍ය පියවර ගනු ලැබේ.

ඉහත ප්‍රවෘත්තිය ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් ඔබ ආයතනය දක්වන සහයෝගය ඉතා අගයකොට සලකමි.

වජිරා බස්නායක
ගරු මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ
මාධ්‍ය ලේකම්
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**වජිරා බස්නායක**
ගරු මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම්
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය